Department of Education, Sabaragamuwa Province/ Weekly School

# ශීඝ්‍රතාව

$$\text{වේගය} = \frac{\text{ගමන් කළ දුර}}{\text{ගතවූ කාලය}}$$

**ඒකක**

| | |
|---|---|
| තත්පර $= s$ | පැය $= h$ |
| කිලෝ මීටර $= km$ | මීටර $= m$ |
| පැයට කිලෝ මීටර $= kmh^{-1}$ | තත්පරයට මීටර $= ms^{-1}$ |

**නිදසුන් :-**

1. දුම්රියක් පැය 2 ක කාලයක දී $180km$ දුරක් ගමන් කරයි. දුම්රියේ වේගය සොයන්න.

   දුම්රියේ වේගය $= \dfrac{180km}{2h} = \underline{\underline{90kmh^{-1}}}$

2. ගුවන් යානාවක වේගය $210kmh^{-1}$ කි. එම ගුවන් යානය මිනිත්තු 20 තුළ කොපමණ දුරක් ගමන් කරයි ද?

   වේගය $= \dfrac{\text{දුර}}{\text{කාලය}}$

   දුර $=$ වේගය $\times$ කාලය

   ගමන් කළ දුර $= \overset{7}{\cancel{210}} \times \dfrac{\overset{10}{\cancel{20}}}{\underset{\underset{1}{\cancel{2}}}{\cancel{60}}} = \underline{\underline{70km}}$

3. $90kmh^{-1}$ ක වේගයෙන් ගමන් කරන $30m$ ක් දුර දුම්රියක් $45m$ ක් දිග දුම්රිය වේදිකාවක් පසු කර යාමට කොපමණ කාලයක් ගත කරයි ද?

   වේදිකාව පසු කිරීමට දුම්රිය යා යුතු මුළු දුර $= 45m + 30m = 75m$

   දුම්රිය $75m$ ක දුර යාමට ගතවන කාලය සොයමු.

   වේගය $= 90kmh^{-1}$

   $= \dfrac{90 \times 1000}{60 \times 60} ms^{-1} = 25ms^{-1}$

   කාලය $= \dfrac{\text{දුර}}{\text{වේගය}}$

   $= \dfrac{75m}{25ms^{-1}} = \underline{\underline{\text{තත්පර } 3}}$

   10 ශ්‍රේණිය ගණිතය පෙළ පොත II හි පිටු අංක 46/47 හි 22.1 අභ්‍යාසයේ යෙදෙන්න.

4. අමල් තම මවගේ නිවසට යාම සඳහා නිවසින් පිටත් වී එහි ගොස් ආපසු ඒම දැක්වෙන දුර කාල ප්‍රස්තාරය පහත දැක් වේ.




   $(i)$. ඔහුගේ ගමන විස්තර කරන්න.
   $(ii)$. ඔහු නිවසට යාමේ දී වේගය සොයන්න.
   $(iii)$. ආපසු ඒමේ දී වේගය සොයන්න.
   $(iv)$. මධ්‍යක වේගය සොයන්න.

පිළිතුරු

$(i)$. නිවසේ සිට මිනිත්තු 20 ක කාලයක් නිවසට ගොස් ඇත. මිනිත්තු 40 න් නිවසේ සිට මිනිත්තු 30 ක් ආපසු පැමිණ ඇත.

$(ii)$. කාලය - මිනිත්තු $20 =$ තත්පර $1200$

දුර $-10km = 10\,000m$

$$වේගය = \frac{දුර}{කාලය} = \frac{10\,000}{1200} = \frac{25}{9} ms^{-1}$$

$(iii)$. දුර $-10km = 10000m$

කාලය මිනිත්තු $30 =$ තත්පර $1800$

$$වේගය = \frac{10000}{1800} = \frac{50}{9} ms^{-1}$$

$(iv)$. මධ්‍යක වේගය $= \frac{ගමන්කළ\ දුර}{ගමනට\ ගත\ වූ\ කාලය}$

ගමන් කළ දුර $= 20km = 20000m$

කාලය $= 20 + 30 =$ මිනිත්තු $50 = 3000\ s$

$$මධ්‍යක\ වේගය = \frac{20000}{3000} = \frac{20}{3} ms^{-1}$$

ගැටලුව:-

| කාලය (පැය) | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|---|
| දුර (මීටර්) | 0 | 50 | 100 | 100 | 100 | 160 | 220 |

$(i)$ මෙම තොරතුරු සඳහා දුර කාල ප්‍රස්තාරයක් අඳින්න.

$(ii)$ ආරම්භයේ සිට මුල් පැය දෙක ගමන් කිරීමේ වේගය සොයන්න.

$(iii)$ හතර වන පැයේ සිට හය වන පැය තෙක් ගමන් කළ වේගය සොයන්න.

10 ශ්‍රේණිය ගණිතය පෙළ පොත II හි පිටු අංක 50 හි 22.2 අභ්‍යාසයේ යෙදෙන්න.

$$පරිමාව\ වෙනස්වීමේ\ ශීඝ්‍රතාව = \frac{වෙනස්\ වූ\ පරිමාව}{ගතවූ\ කාලය}$$

නිදසුන් :-

$(i)$. $600l$ ක ධාරිතාවකින් යුත් ටැංකියක ඇති කරාමයක් විවෘත කළ විට මිනිත්තු 5 ක දී ටැංකිය සම්පූර්ණයෙන් හිස් වේ. කරාමයෙන් ජලය පිට වූ ශීඝ්‍රතාවය ගණනය කරන්න.

$$ජලය\ පිට\ වූ\ සීඝ්‍රතාවය = \frac{පිටව\ ව\ ජල\ පරිමාව}{ගතවූ\ කාලය} = \frac{600l}{5 \times 60\ s} = \frac{600}{300} = 2ls^{-1}$$

මිනිත්තු 5 =තත්පර $5 \times 60$

$(ii)$. ජල ටැංකියකට නලයකින් $6ls^{-1}$ ඒකාකාර ශීඝ්‍රතාවයකින් ජලය ගලා එයි.එම ටැංකියෙන් ජලය පිටවන නල දෙකක් ඇති අතර එක් නලයකින් $1.5ls^{-1}$ ක ඒකාකාර ශීඝ්‍රතාවයකින් ද තවත් නලයකින් $2.5ls^{-1}$ ක ඒකාකාර ශීඝ්‍රතාවයකින් ද ජලය පිට වේ. මෙම ජල ටැංකිය ඝනකාභ ආකාර වන අතර එහි දිග,පළල, උස පිළිවෙලින් $2m$ , $1m$, හා $1.5m$ වේ. ටැංකියේ $600l$ක් ජලය ඇති අවස්ථාවක නල තුනම එකවර විවෘත කලේ නම් ටැංකිය සම්පූර්ණයෙන් ම පිරීමට ගත වන කාලය සොයන්න.

ටැංකියේ ධාරිතාව $= 2m \times 1m \times 1.5m = 3m^3 = 3 \times 1000 = 3000l$

ටැංකියේ පිරීමට ඇති පරිමාව $= 3000 - 600 = 2400l$

ජලය ගලා එන ශීඝ්‍රතාවය $= 6ls^{-1}$

ජලය පිටවන ශීඝ්‍රතාවය $= 1.5 + 2.5 = 4ls^{-1}$

ජලය පිරෙන ශීඝ්‍රතාව $= 6 - 4 = 2ls^{-1}$

$2ls^{-1}$ ක ශීඝ්‍රතාවයෙන් $2400l$ පිරීමට ගත වන කාලය $= \frac{2400}{2} = 1200s$ $=$ මිනිත්තු $\frac{1200}{60} =$ මිනිත්තු 20

10 ශ්‍රේණිය ගණිතය පෙළ පොත II හි පිටු අංක 53 හි 22.3 අභ්‍යාසයේ යෙදෙන්න.